# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| | | | |
|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி: **(94) 011- 2696211-13**<br>Telephone **(94) 011- 2166000** | ෆැක්ස්<br>தொலைநகல்: **(94) 011- 2695279**<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்: **information@pubad.gov.lk**<br>E-mail | වෙබ් අඩවිය<br>இணையத்தளம்: **www.pubad.gov.lk**<br>Web Site |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PS/GT/2020 (IIIවෙළුම) | ඔබගේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி:<br>Date | 2022.01.09 |

**<u>රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020</u>**

**<u>ඒකාබද්ධ සේවාවේ ස්ථිර පත්වීම්ලාභී සංවර්ධන නිලධාරීන් සහ ස්ථිරව පුහුණු සේවා ස්ථානවලට අනුයුක්තවන අභ්‍යාසලාභීන් රාජකාරි භාර ගැනීම</u>**

මගේ 2022.01.07 දිනැති ලිපියේ සඳහන් සබැඳිය (Link) මගින් දැනට සඳහන් කර ඇති (Upload) ස්ථානගත කිරීම්වලට පමණක් ප්‍රවේශවීමට හැකි අතර එම සබැඳිය මගින් පහත ස්ථානගත කිරීම් දැනගත නොහැකි බව ද කාරුණිකව දන්වා සිටිමි.

i. උක්ත වැඩසටහන යටතේ II සහ III අදියර යටතේ බඳවාගන්නා ලද 2021.04.01 දින ස්ථිර පත්වීම් ලැබීමට නියමිත අභ්‍යාසලාභීන්ගේ ස්ථාන ගත කිරීම් ලිපි මේ වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කර ඇත.

ii. පළාත් පාසල් සහ පළාත් සභා පත්වීම් සඳහා යොමු කරන ලද අභ්‍යාසලාභීන් සම්බන්ධයෙන් සියලු නිවේදන පළ කරනු ලබන්නේ අදාළ පළාත් සභා විසිනි.

iii. උක්ත ලිපියේ 07 ඡේදයේ සඳහන් ගැටලු සහිත අභ්‍යාසලාභීන්ගේ තොරතුරු දැකගත හැකි වන්නේ එම ගැටලු නිරාකරණය කිරීමෙන් පසුවය.

02. මෙම බඳවාගැනීමට අදාළ සියලු ස්ථානගත කිරීම් මේ වන විට සිදුකර අවසන් නමුත් ඉහත සඳහන් කළ ගැටලු ද නිරාකරණය කර සියලු ම අභ්‍යාසලාභීන්ට රාජකාරි භාරගැනීමට හැකිවන පරිසරය සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම එළඹෙන සතිය තුළ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

03. එම කාර්යය සාර්ථකව සිදු කළ හැකි වන්නේ උපාධිධාරී අභ්‍යාසලාභී ශාඛාවේ සහ ඒකාබද්ධ සේවා අංශයේ නිලධාරීන්ට එම කටයුතු සිදු කිරීමට අවශ්‍ය පරිසරය මනාව සකස් වුවහොත් පමණක් වන බැවින් මෙම බඳවා ගැනීමට අදාළ ස්ථානගත කිරීම් සහ නම් සඳහන් නොවීම වැනි ගැටලු සම්බන්ධව මෙම අමාත්‍යාංශයට පැමිණ සිදු කරන කිසිඳු විමසීමක් මෙම කටයුත්ත අවසන් වන තුරු එළඹෙන සතිය තුළ බාර නොගන්නා බව නිවේදනය කරනු ලැබේ. එතෙක් ගැටලු විමසීම සඳහා වෙනත් ක්‍රමවේදයක් ඉදිරියේ දී හඳුන්වා දෙනු ලැබේ.

04. එසේම ස්ථිර පත්වීම් ලද අභ්‍යාසලාභී නිලධාරීන් නව සේවා ස්ථාන හා අභ්‍යාසලාභී ස්ථානගත කිරීම් පිළිබඳ දැනුවත් වන තෙක් දැනට සිටින සේවා ස්ථානවලම රැඳී සිටිය යුතු වේ. දෙනු ලබන සාධාරණ කාල සීමාවක් තුළ කිසිවෙකුගේ ජ්‍යෝෂ්ඨත්වයට හෝ වැටුප් සම්බන්ධයෙන් කිසිඳු බලපෑමක් නොවන බව තවදුරටත් දන්වා සිටිමි.

05. අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ස්ථිර පත්වීම් ලබා දුන් නිලධාරීන් සේවයට වාර්තා කළ යුතු ස්ථානය හා දිනය සම්බන්ධයෙන් එම අමාත්‍යාංශය විසින් දැනුවත් කිරීමට කටයුතු කරනු ඇති බව සැලකුව මැනවි.

06. වසරක පුහුණුව සපුරා ඇති සියලු අභ්‍යාසලාභීන්ට සහ වසරක පුහුණුව සපුරන තෙක් ස්ථිර සේවා ස්ථානවලට අනුයුක්ත කරන අභ්‍යාසලාභීන්ට ජනවාරි මස වැටුප් සහ දීමනා ලබා ගැනීමට හැකිවන පරිදි මෙම වැඩසටහන අවසන් කිරීමට ඔබ දක්වන කාරුණික සහ ඉවසිලිමත් සහාය අතිශයින් අගය කරමි.

එස්. ආලෝකබණ්ඩාර

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්